# සිහිනය ජයගත් කුමරිය



ඒ.ජී. ලිතුලි බිනායා අගලවත්ත

කෘතියේ නම :- සිහිනය ජයගත් කුමරිය

කතෘගේ නම :- ඒ.ජී. ලිතුලි බිනායා අගලවත්ත (8 ශ්‍රේණිය G)

කෘතියේ අයිතිය ඇතුළු විස්තර :- ISBN - 978-624-208-435-0

කෘතිය පල කරන දිනය :- 2025-02-08

# පිදුම

අප විද්‍යාලයේ විදුහල්පතිතුමිය

ශෂිකලා සේනාධීර මහත්මියටත්,

මේ ව්‍යාපෘතිය භාරව කටයුතු කළ

සෙනවිරත්න, ගුරු පියාණන්ටත්,

අප විද්‍යාලයේ

ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්,

මාගේ දෙමාපියන්ටත්

උදවුකළ සියලු දෙනාටත්

මාගේ හදපිරි ගෞරවය පුද කර සිටිමි.

# <u>පෙරවදන</u>

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතා කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක රාජධානියක සෙරේනා කියලා පුංචි කුමාරිකාවක් ජීවත් වුණා. ඇය හරිම කරුණාවන්තයි. ලස්සන දක්ෂ කුමාරිකාවක්. ඇය නිතරම සිටියේ රාජකීය මුළුතැන්ගෙයි. මේ සෙරේනා කුමරිය වැඩියෙන්ම කැමති වුනේ උයන්න. ඇයට ඕන වුනේ කවදා හරි හොඳට උයන්න පුළුවන් සුපවේදිනියක් වෙන්න. සෙරේනා කුමරිය දවසක් කෑමක් හදලා රාජකීය මුළුතැන්ගෙයි ප්‍රධාන සුපවේදියාට කිව්වා මේකේ රස බලන්න කියලා, ඉතින් මේ සුපවේදියා කිව්වා, මේකෙ පෙනුමෙන් නම් රස පාටයි කියලා. ඉතින් මේ සුපවේදියා කාලා  බලලා කිව්වා, පෙනුමෙන් විතරක් නෙමෙයි ඇත්තටම මේක ගොඩක් රසයි කියලා. ඊට පස්සේ ඇය කිව්වා මම කොහොමත් දන්නවා මේක රසයි කියලා.



ඉතින් මේ සෙරේනා කුමාරිකාව හැමදාම කෑම ගැන හීන දැක්කා. ඒ වගේම ඈය කෑම වට්ටෝරු ගැනත් සැළකිලිමත් වුණා.

එක දවසක් ඈයට ගුරුතුමා කිව්වා ඉතිහාසය පැවරුමක් කරගෙන එන්න කියලා. නමුත් ඈය ගෙනත් තිබුණේ විස්කොතු වට්ටෝරුවක්. ඒ වෙලාවේ මේ කුමාරිකාවට හිනා ගිහිල්ලා 'අපොයි' කියලා කියවුනා. කාට හරි කුමාරිකාව හමුවෙන්න ඕන නම් ඈයව දැකගන්න වෙන්නේ රාජකීය මුළුතැන්ගෙය තුලදි තමයි. දවසක් රජතුමා මේ පුංචි සෙරේනා කුමාරිකාව හැමතැනම හොයලා නැතිම තැන මුළුතැන්ගෙට ගියා.



ඒ වෙලාවේ කුමාරිකාව මුළුතැන්ගෙයි හිටියා. රජතුමා කුමාරිකාවගෙන් ඇහුවා

"සෙරේනා ඔයා ඔය කේක් හදනවාද කියාලා"

එවිට පුංදි සෙරේනා කුමරිය කිව්වා

"ඔව් හැබැයි මම හදන්නේ ඉඟුරු, දෙහි කේක් එකක්, නැවුම් ඉඟුරු සහ නැවුම් දෙහි දලා තමා මේ කේක් එක හැඳුවේ." ඇය බොහොම සතුටින් කිව්වා.

"හරිම අපුරුයි " කියලා රජතුමා කිව්වා.

"දැන් වෙලාව රාත්‍රි 12.00යි. ඒ වගේම ඔයා මේවා හදන්නේ කාටද?" කියලා රජතුමා සෙරේනා කුමරියගෙන් ඇසුවා.

පුංචි සෙරේනා කුමරිය කිව්වා" මේවා නත්තල් සීයාට කියලා"

සෙරේනා එයාට හම්බවෙන හැම අමුද්‍රව්‍යකින්ම අත්හදා බැලීම් සිදුකළා. හොඳම කෑම හදන අදහසින්.



ඇයගේ කෑම දැකලා අනිත් අය හැමෝම පුදුම වුණා. කාලය ගෙවෙන්න, ගෙවෙන්න ඇය ලස්සන වගේම දක්ෂ සූපවේදියක් වුණා. ඇය හදන කෑම කාලා රාජකීය මුළුතැන්ගෙයි ප්‍රධාන සූපවේදියා කිව්වා

"දැන් නම් මම විශ්‍රාම ගියා නම් හොඳයි " කියලා.

එතකොට කුමරිය කිව්වා "එපා ඔබ තමා මගේ පළමු සහ එකම සූපවේදි ගුරුතුමා, මම මුලින්ම උයන්න ඉගෙන ගත්තේ ඔබගෙන්" කියලා. ඉතින් මෙම කුමාරිකාව එක දවසක් ඇය කැමතිම සුප් කඬේට ගියා. ඇය 'කැරි නෝනා' කියලා කතා කළා. ඒ වෙලාවේ කැරි නෝනා "මගේ කුමාරිකාවෙනි, " කියලා කතා කළා. මේ වෙලාවේ සෙරේනා කුමරිය කැරි නෝනාගෙන් ඇහුවා

"ඔයා මේ සුප් කඬේ වහන්න ද යන්නේ" කියලා.



ඇය මෙහෙම කිව්වා "ඔව් මට ආපනශාලාව කරගෙන යන්න සල්ලි නෑ, ඒවාට යන අමුද්‍රව්‍ය වල මිල ගණන් බොහෝම වැඩියි, හැබැයි මම කැමතිම පාරිභෝගිකයා වෙනුවෙන් මට සුප් එකක් හදලා දෙන්න පුළුවන්" කියලා.

කුමාරිකාව කැරි නෝනා හදන සුප් එක දිහා ඉතා උනන්දුවෙන් බලාගෙන හිටියා. සුප් එක හදලා ඇය ඒක කුමාරිකාවගේ අතට දුන්නා. කුමරිය එක සුප් හැන්දක් බිව්වා. "මේ සුප් එක බිව්වාම මගේ මුළු ඇගම උණුසුම් වෙනවා මට දැනෙනවා" කුමරිය කිව්වා.

"ඔයා මේ සුප් කඩේ වහන එක නම් ලොකු පාඩුවක් වෙයි " කියලා කුමරිය කිව්වා.

එවිට කැරි නෝනා කිව්වා " මම විතරක් නෙවෙයි තේ කඩේ, ඇලසන් මහත්තයා, බනිස් කඩේ ක්ලෝරි මහත්මයා එයාලටත් එහෙමමයි."



සෙරේනා කුමරිය හොඳටම භය වුණා. එදා රෑ මුළුතැන්ගෙයි වැඩ කළත් ඇගේ හිස එක තැනකනම් තිබුණේ නෑ. ඒ වෙලාවේ රාජකීය මුළුතැන්ගෙයි ප්‍රධාන සූපවේදියා ඇයට කිව්වා ඔබට තියෙන හැකියාවන් අනුව ඔබ ආපනශාලාවක් ආරම්භ කළොත් හොඳයි කියලා එවිට කුමරිය කිව්වා

"අන්න හරි මටත් දැන් ඒක තමයි කරන්න ඕන වුනේ."

"කොහොම උනත් ඔබට මාළිගාව දාල යන්න බැහැ. කුමරියනි"

කියලා ප්‍රධාන සූපවේදියා කිව්වා. "නෑ මම මගේ මාළිගාව දාලා යන්නේ නෑ, හැබැයි මම ආපනශාලාවක් පටන් ගන්නවා." කියලා කුමාරිය කිව්වා. ඊට පසුදින කුමාරිකාව ඇගේ ආපනශාලාව පටන්ගන්න සූදානම් වුණා. අර කලින් තමන්ගේ කඩ වහනවා කියූ අයවත් කුමාරිය වැඩට ගත්තා.



සෙරේනා කුමරිය එයාලට කිව්වා

"කිසිම දෙයක් ගැන් දුන් වෙන්න එපා, කෑම හදන එකට පමණක් අවධානය දෙන්න. ඉතුරු හැමදෙයක්ම මම බලා ගන්නම්" කියලා.

වැඩි දවසක් ගෙවෙන්න කලින් සෙරේනා කුමරියගේ ආපනශාලාව පටන් ගත්තා. ඒ වගේම ටිකෙන් ටික ආපනශාලාවට මිනිස්සු වැඩි දෙනෙක් එන්න පටන් ගත්තා. ආපනශාලාවට ආව හැමෝම මෙයාලගේ කෑම රස වින්දා. ටික දිනකින් මේ ආපනශාලාව ප්‍රසිද්ධ වෙන්න පටන් ගත්තා.



එක දවසක් මේ ආපනශාලාවට දඩබ්බර සොරු කණ්ඩායමක් ඇතුල් වුණා. එයාලා ඇතුල්වුණ ගමන් වෙන කෙනෙක්ට ගෙනයමින් සිටි වතුර වීදුරුවක් ගත්තා. එවිට කැරි නෝනා කිව්වා,

"ඇහුනද, මම ඕක ගෙනියන්නේ වෙන කෙනෙක්ට" කියලා

ඇය පිටු පසට හැරුණා. මේ සොරුන්ව දුටු කැරි නෝනා භය වුණා. එවිට සොරු කණ්ඩායමේ නායකයා කිව්වා,

"එයාලා වෙනුවෙන් මම සමාව ගන්නම්" කියලා එවිට කැරි නෝනා කිව්වා "අනේ කමක් නැහැ මොකද අපේ ආදර්ශ පාඨය හැමෝටම කෑම දෙමු කියලනේ"

"එහෙම නම් මට හතු සුප් එකක් ගෙන්න " කියලා නායකයා කිව්වා.



ටික වෙලාවකින් මෙයාලගේ කෑම ටික ලැබුණා. ඔවුන් හරිම ආසාවෙන් කෑම ටික බුක්ති වින්දා. පසුව සොර නායකයා කිව්වා,

"මේ සුප් එකේ හතු හොඳින් තැබ්බිලා තිබෙනවා" කියලා. එවිට තව කෙනෙක් කිව්වා " මේ රහට සුප් හදන්නේ මේ කැරි නෝනා තමා,


"හැබැයි දැන් නම් සුප් එක හැඳුවේ මම නෙමෙයි, ඕක හැඳුවේ අපේ කුමාරිකාව" කියලා කැරි නෝනා කිව්වා.

"එතකොට ඔයා කියන්නේ සුපවේදිනිය කුමාරිකාවක් කියලද? " සොර නායකයා ඇහුවා.

"ඔව් මේ ආපනශාලාවේ ප්‍රධාන සුපවේදිනියත් අපේ සෙරේනා කුමාරිකාව" කියලා.

එවිට සොර නායකයා කිව්වා.

"ආ ඇයව මට හමුවෙලා ඇයට ස්තූති කරන්න ඕන" කියලා.



ඉතිං ඊට පස්සේ මොහු මුළුතැන්ගෙට ගිහිල්ලා ඇයගෙන් ඇහුවා,

"ඔබද සෙරේනා කුමරිය" කියලා. ඇය කිව්වා

"මම තමයි සෙරේනා කුමරිය ඔබට මගෙන් වෙන්න ඕන මොකක්ද?" සොර කණ්ඩායමේ නායකයා කිව්වා

"කට වහගෙන සද්ද නොකර ඉන්න " කියලා ඉන්පසුව ඔහු ඇහුවා

"ඇයි දන්නේ නැද්ද කළු පූස් කණ්ඩායම ගැන, මම තමයි එකෙ නායකයා ජෝන්. "

එවිට සෙරේනා කුමරිය කිව්වා "ආ මම දන්නවා, ඔයාලා නේද මෙහෙ ඉන්න දරුණුම කොල්ලකාරයෝ කියලා ජොන්" කුමාරිය ඇසුවා.

රාජධානියටයි, කුමාරිකාවටයි කරදරයක් නොවෙන්න නම් ලොකු මුදලක් ගෙවන්න වෙනවා කියලා කිව්වා.



රාජධානියට නැතත් කෝකියෙක්ට ආපනශාලාව නැතිවෙනවා කියන්නේ ලොකු දෙයක් කියාලා මම හොඳටම දන්නවා. මොකද මමත් ඉස්සර කෝකියෙක් කියලා සොර නායකයා කිව්වා, එක පාරම සෙරේනා කුමරිය පුදුමවෙලා ඇහුවා ඔබ කෝකියෙක් ද කියලා, එවිට ඔහු කිව්වා ඔව් මම කෝකියෙක් ලොකුකමට කියනවා නෙමෙයි හැබැයි මම දක්ෂ කෝකියෙක්.

ඉතින් දැන් ඔබ මොකද කරන්නේ සෙරේනා කුමරිය. කුමරියට එයාගේ රාජධානියටත් රාජධානියේ ඉන්න මිනිසුන්ටත් කරදරයක් වෙන්න දෙන්න ඕන වුනේ නැහැ. ඒනිසා කුමරිය කල්පනා කරලා බලලා කිව්වා හරි හැබැයි ඔයාට මාත් එක්ක ඉවුම් පිහුම් තරගෙකින් මාව පරද්දන්න වෙනවා කියලා.



"හැබැයි මම දින්නොත් මටයි මගේ රාජධානියටයි එහි සිටින මිනිස්සුන්ටයි කරදරයක් කරන්න බැහැ. හැබැයි ඔයා දින්නොත් ඔයාගේ යෝජනාවට මම එකඟයි."

ඉතින් මේ අනුව තරගය පැවැත්වුණා. කොහොම හරි මෙම තරගයෙන් අපේ සෙරේනා කුමරිය ජයග්‍රහණය කළා. ඉන්පසු ඇය ජොන්ට කිව්වා

"අයෙ කවදාවත්ම සොරකම් කරන්න එපා. මම ඔයාට වෙන තැනක ආපනශාලාවක් දාලා දෙන්නම්, "

කොහොම හරි අයෙ කවදාවත්ම ජෝන් හොරකම් කරන්නේ නැතිව සෙරේනා කුමරිය දාලා දුන්න, ආපනශාලාවේ වැඩ කරගෙන සතුටින් තමන්ගේ ජීවිතය ගත කළා. කොහොම හරි සෙරේනා කුමරිය තමාගේ සිහිනය සැබෑ කර ගත්තා.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN - 978-624-208-435-0